# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2489/05 - 2026 මැයි මස 18 වැනි සඳුදා - 2026.05.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ගල්නෑව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොටගෙන ගල්නෑව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ගල්නෑව ප්‍රාදේශීය සභාවේ අංක 10 - සියඹලන්ගමුව කොට්ඨාසයට තේරී පත් වූ ඒකනායක මුදියන්සේලාගේ ජිනේන්ද්‍රා චන්ද්‍රමාලි ඒකනායක මහත්මිය අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ගල්නෑව ප්‍රාදේශීය සභාව අංක 10 - සියඹලන්ගමුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා දිල්කි අමායා මධුශාණි ශ්‍රී විජේබංඩාර මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ගල්නෑව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, නුවර පක්ෂගේ පිවිතුරු ඉන්දික රවිරාජ් ගුණරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් දිල්කි අමායා මධුශාණි ශ්‍රී විජේබංඩාර මහත්මිය, ගල්නෑව ප්‍රාදේශීය සභාව, අංක 10 - සියඹලන්ගමුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**එන්. පී. පී. අයි. ආර්. ගුණරත්න,**
තේරීම්භාර නිලධාරි,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

EOG 05 - 0192


1A - PG 7708 — 04 (2026/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*